# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුභූරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1411/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 31/08/2024 පැය 1230

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2024.08.30 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 22.5 | 180 | යකඩ බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය**

2024.08.30 වන දින දිවා කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ කොළොන්නාව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් **06** මිලි ග්‍රෑම් **250** ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 20 ක් වන කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය**

2024.08.30 වන දින දිවා කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් විසින් මරදාන පොලිස් වසමේ ජයසේකොරාම වතුරශ්‍රය මාර්ගය ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 31 මිලි ග්‍රෑම් 510 ක්** සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන මරදාන පොලිස් ස්ථානය භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වූ වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**
මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුර.**

2024.08.30 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන් විසින් ඉලුප්පුකඩවායි පොලිස් වසමේ සිප්පිආරු රක්ෂිත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක්** සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඉලුප්පුකඩවායි පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 හා 32ත් අතර වයස් වල පසුවන මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ඉලුප්පුකඩවායි පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**